# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1812/30 – 2013 මැයි 31 වැනි සිකුරාදා – 2013.05.31

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී.– 80/34.

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

පඩිපාලක සභා ආඥාපනතේ (136 පරිච්ඡේදයේ) 20(2)ඩී යන වගන්තිය යටතේ, ඇමතිවරයා විසින් වර්ෂ 1944 නොවැම්බර් මස 03 වැනි දින අංක 9327, වර්ෂ 1949 අප්‍රේල් මස 01 වැනි දින අංක 9963, වර්ෂ 1953 ජූනි මස 25 වැනි දින අංක 10541, වර්ෂ 1958 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 11568, වර්ෂ 1962 ජූනි මස 22 වැනි දින අංක 13179 යන ගැසට් පත්‍රයන්හි පළ කරන ලද නිවේදන මාර්ගයෙන් නියම බලධාරියා ලෙස පත් කරනු ලැබූ ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තැන්පත්, දොන් චන්ද්‍රසිරි අබේරත්න ගුණවර්ධන වන මම, මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් එක් එක් ව්‍යාපාරයෙහි නියුක්ත සේවකයන් කෙරෙහි වර්ෂ 2013 මැයි මාසය තුළ අදාළ කළ හැකි ජීවන වියදම් දර්ශකාංකය (2006/07 පදනම් වූ) 173.9 වන බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

**ඩී. සී. ඒ. ගුණවර්ධන,**
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්.

2013 මැයි මස 31 වැනි දින,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 563,
කොළඹ.

උපලේඛනය

1. කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීමේ සහ සැදීමේ ව්‍යාපාරය.

06 – 552/1


1A – PG 1651 – 920 (2013/06)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## කොකෝවා, කරදමුංගු හා ගම්මිරිස් වැවීම හා සැදීම යන කර්මාන්තවල නියුතු සේවකයන්ට ගෙවිය යුතු විශේෂ දීමනා

ඉහත සඳහන් කර්මාන්තය සඳහා 2013 මැයි මාසයේ ජීවන වියදම් අංකය 173.9 වන නිසා 2013 ජුනි මාසයේ සාමාන්‍ය වැඩකරන දිනයක් වෙනුවෙන් ගෙවිය යුතු විශේෂ දීමනා පහත දැක්වෙන ආකාරයට බැව් පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

**කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීම හා සැදීමේ කර්මාන්තය**

| *සේවා පන්තිය* | *සාමාන්‍ය වැඩකරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනා* |
|---|---|
| | *රු. ශ.* |
| *දෛනික වැටුප් ලබන්නෝ –* | |
| කම්කරුවෙකුට - පිරිමි/ගැහැණු | 532.33 |

**එම්. ඩී. චාන්දනී අමරතුංග,**
කම්කරු කොමසාරිස් (වැ.බ.).

2013 මැයි මස 31 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

06 – 552/2

---

## පඩිපාලක සභා ආඥාපනත

නිවේදනයයි

**පවිත්‍රතා සේවා කර්මාන්තය**

පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 30 වැනි වගන්තිය යටතේ, පවිත්‍රතා සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන තීරණ ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2013 ජුනි මස 01 දින සිට වලංගු විය යුතුය.

**ඩබ්ලිව්. ජේ. එල්. යූ. විජයවීර,**
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2013 මැයි මස 31 වැනි දින,
කම්කරු මහලේකම් කාර්යාලය,
කොළඹ 05.

උපලේඛනය

කම්කරු කොමසාරිස් විසින් පවිත්‍රතා සේවා කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවන්ගේ කාල මිම්මේ වැඩ සඳහා වන අවම වේතනවලට අදාළව කරන ලද 1993.07.07 වැනි දින අංක 774/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නිවේදනයේ උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇත්තා වූ ද කලින් කල වෙනස් කරන ලද්දා වූද අවසන් වරට 2010 මැයි මස 31 වැනි දින අංක 1656/10 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද තීරණ වල 1 කොටසෙහි පවිත්‍රතා කර්මාන්තයේ නියුක්ත සේවකයන් කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාළ විය යුතු අවම දෛනික වේතන ප්‍රමාණය සඳහා පහත නව කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් විය යුතුය.

| *I තීරය* | *II තීරය* |
|---|---|
| | *වැඩකරන සාමාන්‍ය දවසක් සඳහා වේතන ප්‍රමාණය* |
| | *රු. ශ.* |
| *(අ)* *ක්‍රියාකාරී සේවාවන්–* | |
| පිරිසිදු කරන්නන්, සනීපාරක්ෂක කම්කරුවන්, ජැනිටර්ස් හෝ කිනම් නමකින් හැඳින්වුවද ආයතන හා කාර්යාල සුද්ධ පවිත්‍ර කිරීමේ සේවාවන්හි යෙදෙන සේවකයින් | 380.00 |
| *(ආ)* *පාලනමය සේවාවන්–* | |
| ක්‍රියාකාරී සේවාවන්හි පාලනයෙහි නියුක්ත සේවකයින්, කාර්යභාර සේවකයින්, සේවාමුර භාර සුපර්වයිසර්වරු හෝ සුපර්වයිසර්වරු | 445.00 |

06 – 552/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.